# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | විද්‍යාව | 2 ඒකකය |
|---|---|---|

## ඇස හා කන

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- නිවැරදි පිළිතුරු යටින් ඉරි අඳින්න.

01. ඇස තුළ පවතින පාරදෘශ්‍ය කොටසක් නොවන්නේ,

(1). ස්වච්චය (2). අම්මය රසය (3). කාච රසය (4). දෘෂ්ටිවිතානය

02. දෘෂ්ටිවිතානයේ ආලෝකයට සංවේදී සෛල නොපිහිටන ස්ථානය පහත සඳහන් ඒවායින් කවරක්ද?

(1). කහ ලපය (2). ස්වච්චය (3). මධ්‍යකූපය (4). අන්ධ බින්දුව

03. දෘෂ්ටි ආබාධ සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1). දුර ඇති වස්තු පැහැදිලිව පෙනෙන නමුත් ළඟ වස්තු පැහැදිලිව නොපෙනීම අවිදුර දෘෂ්ටිකත්වය

(2). දුර දෘෂ්ටිකත්වය සඳහා අවතල කාච යෙදූ උපැස් පළඳියි

(3). දුර ඇති වස්තු පැහැදිලිව පෙනෙන නමුත් සමීපව ඇති වස්තු පැහැදිලිව නොපෙනීම දුර දෘෂ්ටිකත්වයයි

(4). දුර දෘෂ්ටිකත්වය හා අවිදුර දෘෂ්ටිකත්වය ප්‍රවේණිගත ආබාධ වේ.

04. ප්‍රතියෝජක පේශි මගින් සිදුකරන කාර්යයක් වන්නේ,

(1). ඇස අක්ෂි කාචය තුළ චලනය කරවීම

(2). අක්ෂි කාචයේ වක්‍රතාවය පාලනය කිරීම

(3). තාරා මණ්ඩලය පාලනය කිරීම

(4). මොළය වෙත පණිවිඩ ගෙනයාම

05. ඇස තුළ සෑදෙන ප්‍රතිබිම්බයේ ලක්ෂණය වන්නේ,

(A). තාත්විකය (B). උඩුකුරුය (C). විශාලය

(1). A හා B (2). B හා C (3). A හා C (4). A පමණි

06. සාමාන්‍ය ව්‍යවහාරයේදී කළුඉංගිරියාව ලෙස හඳුන්වන්නේ,

(1). දෘෂ්ටිවිතානය (2). තාරාමණ්ඩලය (3). ස්වච්චය (4). කණිනිකාව

07. ඇසේ කාචයේ පාරදෘශ්‍ය ස්වභාවය අඩුවීම නිසා ඇතිවන රෝගී තත්වය කුමක්ද?

(1). නිශා අන්ධභාවය

(2). සුද ඇතිවීම

(3). ග්ලූකෝමාව

(4). පූර්ණ අන්ධභාවය

08. පහත ප්‍රකාශ අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(1). වක්‍රතාවය වැඩිවන විට කාචයේ නාභිදුර වැඩිවේ.

(2). වක්‍රතාවය අඩුවන විට කාචයේ නාභිදුර අඩුවේ.

(3). වක්‍රතාවය වැඩිවන විට කාචයේ නාභිදුර අඩුවේ.

(4). නාභිදුර වක්‍රතාවය කෙරෙහි බලනොපායි.



EXAMRESULTS.LK

09. පුළුල් ද්විනේත්‍රික දෘෂ්ටියක් සහිත සත්වයෙකු නොවන්නේ,

(1). බල්ලා (2). උණහපුළුවා (3). චිම්පන්සියා (4). ගෝරිල්ලා

10. මිනිසාගේ ශ්‍රව්‍යතා සීමාව කොපමණද?

(1). 20Hz - 2 000Hz
(2). 20Hz - 200Hz
(3). 2Hz - 20 000Hz
(4). 20Hz - 20 000Hz

11. මැද කන හා ග්‍රසනිකාව සම්බන්ධ නාළය කුමක්ද?

(1). යුස්ටේකීය නාළය
(2). අර්ධ චක්‍රාකාර නාළය
(3). බාහිර ශ්‍රවණ නාළය
(4). කර්ණ සංඛය

12. කර්ණ අස්ථිකා පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1). මුද්ගරිකාව, ධරණකය, නිසාතිය
(2). මුද්ගරිකාව, නිසාතිය, ධරණකය
(3). නිසාතිය, මුද්ගරිකාව, ධරණකය
(4). ධරණකය, නිසාතිය, මුද්ගරිකාව

13. ඇසේ දෘෂ්ටික ස්නායුවට හානි සිදුවීම නිසා දෘෂ්ටි පරාසය ක්‍රමයෙන් අඩුවී අන්ධභාවයට පත්වීම,

(1). ඇසෙහි සුද ඇතිවීම
(2). වර්ණ අන්ධතාවය
(3). දුර දෘෂ්ටිකත්වය
(4). ග්ලූකෝමාව

14. කනෙහි ව්‍යුහය හා කෘත්‍යය පිළිබඳ ශිෂ්‍යයෙකු ඉදිරිපත් කළ අදහස් කීපයක් පහත දැක්වේ.

A - කන ශ්‍රවණ සංවේදන ප්‍රතිග්‍රහණය කෙරෙන අවයවයයි.

B - කර්ණ සංඛය මගින් සිරුරේ සමබරතාවය රැකදෙයි.

C - අර්ධ චක්‍රාකාර නාළ මගින් ශ්‍රවණය පිළිබඳ සංවේදන ශ්‍රවණ ස්නායුවට ලබාදෙයි.

මෙම ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

(1). A පමණි
(2). A හා B පමණි
(3). A හා C පමණි
(4). A, B, C ප්‍රකාශ තුනම සත්‍යය වේ

15. දේහ සමතුලිතතාවය පවත්වාගෙන යාමට ආධාර වන කනේ පිහිටි ව්‍යුහය කුමක්ද?

(1). අර්ධ චක්‍රාකාර නාළ
(2). කර්ණ සංඛය
(3). ශ්‍රවණ ස්නායුව
(4). යුස්ටේකීය නාළය

16. යුස්ටේකීය නාළය පිහිටා ඇත්තේ,

(1). බාහිර ශ්‍රවණ නාළය තුළය
(2). බාහිර කන තුළය
(3). මැද කනෙහිය
(4). ඇතුල් කනෙහිය

17. ඇස අක්ෂිකූපයට සම්බන්ධව ඇත්තේ,

(1). අක්ෂි පේශි 4 ක් මගිනි
(2). අක්ෂි පේශි 6 ක් මගිනි
(3). අක්ෂි පේශි 2 ක් මගිනි
(4). අක්ෂි පේශි 8 ක් මගිනි

18. දෘෂ්ටි විතානය මත යෂ්ටි හා කේතු සෛල පිහිටා නොමැති ස්ථානයක් වන්නේ,

(1). කහ ලපය (2). මධ්‍ය කූපය (3). අන්ධ බින්දුව (4). දෘෂ්ටික ස්නායුව

19. ඇසෙහි රුධිර පීඩනය වැඩිවීම නිසා ඇතිවන අක්ෂි රෝගය නම්,


(1). ඇසේ සුද ඇතිවීම
(2). ග්ලූකෝමාව
(3). අක්ෂි ආසාධන
(4). නිශා අන්ධභාවය

20. කනෙහි පිහිටි කොටසක් නමුත් ශ්‍රවණය හා සම්බන්ධ කෘත්‍යයක් ඉටු නොකරන ව්‍යුහය වන්නේ,

(1). දෘෂ්ටික ස්නායුව
(2). කර්ණ සංඛය
(3). අර්ධ චක්‍රාකාර නාළ
(4). කර්ණපටහ පටලය

## II කොටස

01. ඇසෙහි සිරස්කඩක රූපයක් පහත දැක්වේ.




(i). ඉහත රූපයේ 1-6 දක්වා කොටස් නම් කරන්න.

a). ..............................................
d). ..............................................
b). ..............................................
e). ..............................................
c). ..............................................
f). ..............................................

(ල ½×6=3)

(ii). 2, 3, 5, 6 කොටස්වලින් සිදුකරන කෘත්‍යය ලියන්න.

a). 2 - ..............................................
b). 3 - ..............................................
c). 5 - ..............................................
d). 6 - .............................................. (ල.4)

(iii). පහත කාර්යයන් සිදුකරන ව්‍යුහ නම් කරන්න.

a). ඇසට ආලෝකය ඇතුලුවීමට සලස්වන පාරදෘෂ්‍යය කොටස. ..................................
b). ප්‍රතිබිම්බය ලබාගන්නා තිරයක් ලෙස ක්‍රියාකරන කොටස. ..................................
c). කණිනිකාවේ ප්‍රමාණය පාලනය වන්නේ මෙම කොටසෙනි. .................................. (ල.4)

(iv). ඇසට ආරක්ෂාව සඳහා කඳුළු ග්‍රන්ථි වැදගත් වේ.

ඇසට ආරක්ෂාව සපයන වෙනත් හැඩගැසීම් 2ක් ලියන්න.

a). ........................................................................................................................

b). ........................................................................................................................ (ල.2)

(v). කඳුළුවලින් ඇසට සැලසෙන වාසි 2 ක් ලියන්න.

a). ........................................................................................................................


b). ........................................................................................................................ (ල.2)

(vi). අක්ෂි පේශි මගින් කෙරෙන කෘත්‍යය කුමක්ද?

........................................................................................................................ (ල.1)

(මුළු ලකුණු 16)

02. මිනිස් කනක ව්‍යුහය දැක්වෙන රූපසටහනක් පහත දැක්වේ.




(i). A, B, C කොටස් නම් කරන්න. (ල.3)

(ii). 1 සිට 8 දක්වා කොටස් නම් කරන්න. (ල.4)

(iii). 5, 6, 8 කොටස්වල කෘත්‍යය ලියන්න. (ල.3)

(iv). අතිධ්වනි තරංග යනු මොනවාද? (ල.1)

(මුළු ලකුණු 11)

03. ඇස මගින් පෙනීම පිළිබඳ සංවේදන ලබාගනියි.

(i). ඇසෙහි ඇති පහත කොටස්වලින් ඉටුවන කෘත්‍යය ලියන්න.

a). අක්ෂි කාචය

b). ප්‍රතියෝජක පේශි (ල.2)

(ii). ඉතා ඈතින් පිහිටි වස්තුවක ප්‍රතිබිම්බය සෑදෙන ආකාරය ඇඳ පෙන්වන්න. (ල.2)

(iii). ඔබ දන්නා අක්ෂි දෝෂ 2 ක් ලියන්න. (ල.2)

(iv). දුර දෘෂ්ටිකත්වයට හේතු 2 ක් ලියන්න. (ල.2)

(v). දුර දෘෂ්ටිකත්වයට පිළියම් යොදා ඇති ආකාරය රූප සටහනකින් ඇඳ දක්වන්න. (ල.3)

(මුළු ලකුණු 11)

04. ශ්‍රවණ සංවේදනය මගින් බොහෝ පරිසර වෙනස්කම් හඳුනාගත හැක.

(i). ශ්‍රවණ සංවේදන ප්‍රතිග්‍රාහකය සඳහා ඇති ව්‍යුහය කුමන නමකින් හැඳින්වේද? (ල.1)

(ii). කර්ණ අස්ථිකා තුන පිළිවෙලින් ලියන්න. (ල.2)

(iii). කන තුළ ධ්වනි තරංග ගමන් කරන මාර්ගය පහත ගැලීම් සටහනෙන් දැක්වේ. එහි හිස්තැන් පුරවන්න.

බාහිර ශ්‍රවණ නාළය → ........................ → ........................ → කර්ණ සංඛය → ........................ → මොළය (ල.3)

(iv). උපතින්ම බිහිරි බව ඇතිවීමට හේතු 2 ක් කනෙහි ව්‍යුහය ඇසුරින් පැහැදිලි කරන්න. (ල.2)

(v). අඩු ශ්‍රවණ හැකියාවක් ඇති අයට එය වැඩිකර ගැනීමට කළහැකි පිළියම කුමක්ද? (ල.1)


(vi). කන ආරක්ෂා කිරීමට කළහැකි පූර්වෝපායන් 2 ක් ලියන්න. (ල.2)

(මුළු ලකුණු 11)


05. (A). යමක් දැකීම සඳහා හොඳින් ආලෝකය තිබිය යුතුය.

(i). පහත සඳහන් අවස්ථාවලදී ආලෝකය වර්තනය සිදුවන ආකාරය ඇඳ පෙන්වන්න.

c).



d).



(ල.2)

(ii). නාභිය යනු කුමක්ද? (ල.1)

(iii). ඉහත ඔබ සම්පූර්ණ කරන ලද කිරණ සටහනේ නාභිය ලකුණු කරන්න. (ල.2)

(B). සචිඳුට පාඩම් පොත කියවීමේදී අකුරු බොඳව පෙනෙන බවත් කළු ලෑල්ලේ අකුරු හොඳින් පෙනෙන බවත් පවසයි.

(i). ඔහුට ඇති දෘෂ්ටි දෝෂය කුමක්ද? (ල.1)

(ii). එම දෝෂය ඇතිවන අයුරු කිරණ සටහනක් මගින් පෙන්වන්න. (ල.2)

(iii). ඔහුගේ දෘෂ්ටි දෝෂය මඟහරවා ගැනීමට කුමක් කළ යුතුද? (ල.1)

(iv). ඔහුගේ දෘෂ්ටි දෝෂයට පිළියම් කළ පසු හොඳින් පෙනීමට හේතුව කිරණ සටහනකින් දක්වන්න. (ල.2)

(මුළු ලකුණු 11)